# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/13 - 2020 ජුනි මස 30 වැනි අඟහරුවාදා - 2020.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා.ලේ. යොමු අංකය*: හගු/ප්‍රා.ලේ./3/2/1/479B.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : ජේ 74 ඊ 32.

නු/වදවල විද්‍යාලයේ සංවර්ධන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොක කෝරළේ, කළුඅත්තන ගොල්ල ග්‍රාම නිළධාරී වසමේ, කළුඅත්තනගොල්ල නැමති ග්‍රාමයේ මු.පි.නු. 573 දරන මූලික පිඹුරේ කැබලි අංක 2 වශයෙන් මැන ඇති කපුකොටුව නමැති ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 0, පර්චස් 07.4 කින් සමන්විත වූ පහත දැක්වෙන ඉඩම:

**කැබලි අංකය 02**

ඉඩමේ නම: කපුකොටුව; ඉඩමේ හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: 01. කේ. ඒ. ටියුඩර් සිල්වා, ශ්‍රී නගර්, රයිලන් පෙදෙස, කොල්ලුපිටිය 02. සුජාතා කුඩාමැණිකේ, ඇහැලමල්පේ, තුම්පලහපුව, කරඳගොල්ල, 03. දයා ඇහැලමල්පේ, ඇහැල නිවස, කරඳගොල්ල, 04. සී. බී. වීරසූරිය, හෙළසිරිහෝටලය, රිකිල්ලගස්කඩ; ප්‍රමාණය: අ. 1, රූඩ් 0, පර්. 07.4.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය පවරන ලද අයවලුන් හෝ 2020.07.23 දින පෙරවරු 9.30 ට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.07.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2020 ජුනි මස 29 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 396

**ශුද්ධිපත්‍රය**

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : දෙහි/2-1/2/අත්/748.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තිය යටතේ පහත විස්තර කරන ඉඩමට අදලව 2020 මාර්තු මස 03 වන දින මවිසින් අංක 2165/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ III වැනි කොටසේ ඉඩම් යටතේ පළ කරන ලද දැන්වීම සංශෝධනයකර පහත දැක්වෙන පරිදි පළකරනු ලැබේ.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තර :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද, මු.පි.කො. 9882 දරන පිඹුරේ පෙන්නුම් කරන ලද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0605 ක් පමණ වූ ඉඩම් කැබලි.

ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ,

01. මු.පි.කො. 9882 කැබලි අංක 01-2020 අගෝස්තු 28 වන දින පෙ.ව. 10.00.

02. මු.පි.කො. 9882 කැබලි අංක 02-2020 අගෝස්තු 28 වන දින පෙ.ව. 11.00.

03. මු.පි.කො. 9882 කැබලි අංක 03-2020 අගෝස්තු 28 වන දින ප.ව. 12.00 ට දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 අගෝස්තු මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02 සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ඔප්පු හා අනෙකුත් ලේඛන පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

නලිනී බාලසුබ්‍රමනියම්,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
දෙහිවල.

2020 ජුනි මස 30 වැනි දින,<br>
154, ගාලු පාර,<br>
දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 397

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.